මාධ්‍ය නිවේදනයයි..

**කතරගම කිරිවෙහෙර මාර්ගයේ නව මල් කඩ පෙළ සිඬාලේප සමූහ ව්‍යාපාරයෙන් ජනතා අයිතියට.**

ශ්‍රී ලාංකීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ දශක 09ට වඩා අධික කාලයක් පුරාවට පාරිභෝගික විශ්වාසය දිනාගනිමින් ආයුර්වේද නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් ලෙස සිඬාලේප සමූහ ව්‍යාපාරය ප්‍රචලිත වේ. එහි නිර්මාතෘ දිවංගත සහස්‍රාභිෂේක වෛද්‍යශූරී දේශබන්දු ආයුර්වේද වෛද්‍ය ආචාර්ය වික්ටර් හෙට්ටිගොඩ මහතාගේ උදාර සංකල්පයකට අනුව 80 දශකයේ දී ඉදිකර තිබූ ඓතිහාසික කතරගම කිරිවෙහෙර රජමහා විහාරය වෙත පිවිසෙන ප්‍රධාන මාර්ගයේ මල්කඩ පෙළ එතුමාට පිං අනුමෝදන් වීම පිණිස නවීන ලෙස අලුතින්ම ඉදි කරමින් ජනතා අයිතියට පත් කිරීමේ පුණ්‍යෝත්සවය පසුගිය දා ගෞරවාන්විත අයුරින් පැවැත්විණි.

එතුමාගේ සමාජ සත්කාරක දැක්මේ ප්‍රධාන අරමුණක් වූයේ කතරගම ප්‍රදේශයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සහ ඔවුන් ස්වයං රැකියා නියුක්ත ව්‍යවසායිකාවන් බවට පත් කිරීමයි. පවුලේ ආදායමට දායක විය හැකි තිරසාර ජීවනෝපායක් ඔවුන්ට උදාකර දීමේ අරමුණින්, 1980 දශකයේදී ඓතිහාසික කතරගම කිරිවෙහෙර රාජමහා විහාරය වෙත පිවිසෙන ප්‍රධාන මාර්ගයේ මල්කඩ ඉදිකර ඔවුන් වෙත භාරදීමට එතුමා පියවර ගත්තේය.

ඒ හරහා කතරගම පුදබිම වෙත පැමිණෙන බැතිමතුන් සඳහා විධිමත් හා සංවිධානාත්මක මල් අලෙවියක් ආරම්භ වූ අතර, ප්‍රදේශයේ කාන්තාවන්ට ස්ථාවර ආදායම් මාර්ගයක් ද උදා විය. කාන්තා ආර්ථික සවිබල ගැන්වීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ මෙම ආදර්ශවත් ව්‍යාපෘතිය පසුකාලීනව දිවයිනේ අනෙකුත් ප්‍රධාන පුදබිම්වලද මල්කඩ ඉදිකිරීම සඳහා ආදර්ශයක් බවට පත්විය.

මෙම නව මල්කඩ විවෘත කිරීම ඓතිහාසික කතරගම කිරිවෙහෙර රජමහා විහාරයේ විහාරාධිපති රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන සංඝනායක අතිපූජ්‍ය කොබවක ධම්මින්ද නාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. මෙම අවස්ථාව සඳහා සිඬාලේප සමූහ ව්‍යාපාරයේ සභාපති අසෝක හෙට්ටිගොඩ මහතා, විද්‍යානි හෙට්ටිගොඩ මහත්මිය සහ ලංකානි හෙට්ටිගොඩ මහත්මිය ඇතුළු ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ද, කතරගම කිරිවෙහෙර රජමහා විහාරයේ ගිහි භාරකරු සශික බඹරැන්ද මහතා, රුහුණු කතරගම මහා දේවාලයේ ගරු බස්නායක නිලමේ තිලිණ මධුශංක මහතා, හිටපු නාවික හමුදාපති ප්‍රියන්ත පෙරේරා මහතා ඇතුළු ආගමික,රාජ්‍ය හා සාමාජීය ක්ෂේත්‍ර නියෝජනය කරමින් සම්භාවනීය ආරාධිතයන් රැසක් සහභාගී වූහ.

තවද මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රමදායකත්වය සැපයූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ කාර්‍ය මණ්ඩලය සහ මෙහි සැලසුම් හා අධීක්ෂණය සිදු කළ ජාතික භෞතික සැලසුම් දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් ඇගයීමට ලක් කිරීමද මෙම අවස්ථාවේදී සිදුවිය. සමාජ සත්කාර, ආගමික උරුමයන් සුරැකීම සහ ශ්‍රී ලාංකීය සංස්කෘතික වටිනාකම් පෝෂණය කිරීම වෙනුවෙන් දශක ගණනාවක් පුරා කැපවී සිටින සිඞාලේප සමූහ ව්‍යාපාරය දිවංගත සහශ්‍රාභිෂේක වෛද්‍යශූරී දේශබන්දු ආයුර්වේද වෛද්‍ය ආචාර්‍ය වික්ටර් හෙට්ටිගොඩ මහතාගේ දැක්ම අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් මෙවැනි සාමාජීය වටිනාකමින් යුතු ව්‍යාපෘති රැසක් අඛණ්ඩව ඉදිරියටත් ක්‍රියාත්මක කරමින් සිටියි.